

SINGHALESE

# PROTECT THE MALDIVES

## ප්‍රිය සංචාරකයිනි, මාලදිවයිනට සාදරයෙන් පිළිගනිමු !

මාලදිවයින දූපත්, මිහිපිට ඇති අවසාන සවර්ගයන්ගෙන් එකකි. එය එසේ තහවුරුකර පවත්වාගැනීමට අපට උපාකාරී වනු මැනවි. පුදුමාකාර නිවාඩුවක් ඔබට මෙහි ගතකළ හැකිය. ඔබගේ සහයෝගය ඇතිව, අනාගත පරම්පරාවටද මෙම සවර්ගයේදී විනෝදයෙන් ගත කිරීමට අවස්ථාවක් උදාවනු ඇත. Jacques Cousteau විසින් ප්‍රකාශ කර ඇති පරිදි,

මනුෂ්‍යයා මෙම සවර්ගයේ ආගන්තුකයෙකු වන අතර ඒ අනුව ඔහු හැසිරිය යුතුය.

අපගේ ඉල්ලීම වනුයේ, ඔබ නිවාඩුව ගත කරන අවස්ථාවේදී, පහත සඳහන් මග පෙන්වීම් අනුගමනය කරන ලෙසටත්, අවශ්‍ය නම් වෙනත් අයගෙන්ද එවැනිම ඉල්ලීමක් කරන ලෙසටත්ය.

## පාතාල ජලයේ පිහිටි ලෝකය



මාලදිවයින දූපත් මිහිතලයේ අද්විතීය ස්ථානයක් හොබවයි. ඔබ දැනට ගතකරනු ලබන්නේ හිරිගල් වලින් සැදුම්ලත් දිවයිනක්ය. මෙකී හිරිගල් නොතිබුණේ නම් කිසිදු දිවයිනක් සොයාගැනීමට නොහැකි වනු ඇත. එම නිසා හිරිගල් අරකෂා කිරීමට අපට සිදුවේ. ඔබ සිතන්ණෙත්, ඔබ දකින්නෙත්, ජලයේ ගලක් තිබෙන බවයි. නැත එසේ නොවේ ! එය සජීවී හිරිගලකි. ඔබ දකින්නේ හුණු වලින් සැදුම්ලත් නිෂ්පාදනයකි. එය ශත වෂී ගණනාවක් ඇවෑමෙන් මෙකී බහුපාදීන් ලකෂ එකතුවකින් ගොඩනැගුණු අවස්ථාවකි. මෙකී බහු පාදීන් කෙතරම් කුඩා දැයි කිවහොත් ඔබගේ පියවි ඇසට නොපෙනෙති. ඔබ හිරිගලක් සපර්ශ කළ හොත් බහුපාදීන් විනාශ වේ.

හිරිගල්පරය වනාහි, වෂීපතනයෙන් පසු මිහි මත පිහිටි සංකීර්ණතම ස්වභාවික පරිසර පද්ධතිය වේ. ජීවීන් වගී 100, 000 කට වැඩි ගණනක් මෙහි වෙසෙති. ස්වභාවික පරිසර පද්ධතියේ මධ්‍යස්ථානය මෙම හිරිගල් වේ.

එමනිසා, හිරිගල් ස්පර්ශ නොකරන්න !



හිරිගල් වෙත පහසු ප්‍රවේශයක් සඳහා ඇතිකරමින් කිමිදීමට සහ දිය යට පිහිනීම සඳහා මාවතක් සළකුණු කරමින් සෑම දූපතක්ම විශේෂයෙන් නිර්මාණ වී ඇත. හිරිගල් නොපාගා මෙම ප්‍රවේශ මාවත් පාවිච්චි කරනු මැනවි. එසේම දිය යටින් පීනා යාමේදී මුහුදේ වඩදිය, බාදිය වෙනස්වීම් ගැන සිත තබා ගත යුතුය. කිමිදුම් පදනමින්, තොරතුරු ලබාගන්න. වඩදියේදී හිරිගල් පරයට ඉහළින් පිහිණුම් කරන විට, බාදියේදී ඔබගේ ගමණට බාධා පමුණුවනු ඇත.

හිරිගල් පරය මත, කිසිවිට ඇවිද නොයන්න !



මාලදිවයින දූපත්වල ඇති හිරිගල් උයන, ලෝකයේ සුන්දරතම උයන වශයෙන් සැලකේ. මෙම ස්වභාවික පරිසර පද්ධතියේ සංකීර්ණභාවය සිතාගැනීමටවත් නොහැකිය. මනුෂ්‍යයාට හැර සෑම ප්‍රාණියෙකුටම ජීවත්වීමේ ස්ථානයක් ඇත. එමනිසා, සෑම ප්‍රාණයෙකුටම ජීවත්වීමේ ස්ථානයක් ඇත. එම නිසා මෙම ජලයෙන් යට පිහිටි ලෝකයේදී ආගන්තුකයෙක් වශයෙන් හැසිරීමට වග බලාගන්න. කිසිවක් ස්පර්ශ නොකරන්න ! සතුන්ට ජීවත් වීමට ඇති ඉඩකඩ ගැන ගෞරවයෙන් මෙනෙහි කරන්න. මවිතයට පත්කරන විවිධ ප්‍රාණීන් දැක බලා ආගන්තුකයෙක් වශයෙන් ප්‍රීතියට පත්වන්න.

සතුන්ගේ ජීවත්වන ඉඩකඩ ගැන ගෞරවනීය ලෙස සිතා ඔවුන් කිසිවෙකු ස්පර්ශය නොකරන්න. !

## කුණු කන්දල්



ඉන්දියානු සාගරයේ මැද ඇති කුඩා දූපතක ඔබ සිටින බව මතක තබා ගනු මැනවි. කසල බැහැර කිරීම මාලදිවයින දූපත්වල ඇති අසීරු කාර්යයකි. එය අනාගතයේ ඇති විශාලතම අභියෝගයකි. නිෂ්පාදනය වන කසල සියල්ල පුළුස්සා දැමිය යුතුය. කසල වලක්වාලීමට උපකාරීවන්න. කුණු කන්දල් යලි ඔබගේ නිවසට ගෙන ගොස් නව ප්‍රතිචක්‍රීකරණය තිබේනම් ඒ සඳහා යොමු කරන්න. මාලදිවයිනේ එවැනි පහසුකම් නොමැත. හිරු එළියට ඔරොත්තුදෙන පූණී ක්‍රීම් බඳුනක් ඔබ ගෙන ගිය හොත්, හිස් බඳුන ගෙදර ගෙන ගොස් නියමිත ලෙස බැහැර කරන්න.

මෙම සවර්ගය පවිත්‍රව තබාගැනීමට ඔබගේ යුතුකම ඉටු කරන්න!

PROTECT THE MALDIVES

## දුම්වැටි (සිගරෙට්ටු)



දුම්වැටිවල කොටස් වීසි නොකරන්න. ස්වභාවික වශයෙන් දුම්වැටිවල පෙරහන් කොටස දිරාපත්වීමට වෂී 200 ට වැඩි කාලයක් ගතවනු ඇතැයි අපේක්‍ෂා කෙරේ. එයට පෙර කැස්බෑවන් සහ වෙනත් සතුන් විසින් එකී දුම්වැටි කොටස් ගිල දැම්ම හේතුකොට භයානක මරණ අත්වීමට ඉඩ ඇත. ඔබ වෙරළබට හෝ කිමිදුම් බොට්ටුවේ සිටී නම් ආදර්ශමත් වන්න.

දුම්වැටි කොටස් වීසි නොකරන්න !

## බලශක්තිය



දිවයිනේ පිහිටි ඩීසල් විදුලි ජනක යන්ත්‍රයකින් ඔබ බංගලාවේ ඇති සෑම විදුලි ඒකකයක්ම නිපදවනු ලැබේ. පරිසරය මත තෙරපීම අඩු කිරීම සඳහා බල ශක්තිය ඉතිරි කර ගැනීම සඳහා ඔබගේ යුතුකම ඉටු කරන්න. ඔබට අත්‍යාවශ්‍ය නම් පමණක් වායු සමීකරණයන්ත්‍ර පාවිච්චි කරන්න. රාත්‍රී කාලයේදී, පඩිපෙළවල විදුලි ලාම්පු නිවා දමන්න. ශීත කරණයේ ක්‍රියාකාරී තත්වයද අඩු කරන්න. බැටරි විදුලි උත්පාදක යන්ත්‍ර වැනි උපකරණ ඔබ ගෙනැවිත් තිබේනම් ඒවා අඩුවෙන් පාවිච්චි කරන්න.

බලශක්තිය ඉතිරි කරනු මැනවි !

## ජලය



ඔබගේ දිවයිනේ පිහිටා ඇති පවිත්‍ර ජල නිෂ්පාදනාගාරයෙන් සෑම පවිත්‍ර ජන බිංදුවක්ම නිපදවනු ලබයි. මාලදිවයින දූපත්වල ඉතාම වටිනා ද්‍රව්‍යය වන්නේ පවිත්‍ර ජලයයි. ජලය ඉතිරි කිරීමට ඔබගේ යුතුකම ඉටුකරන්න. උදාහරණයක් වශයෙන් රැවුල බාන විට ජලය අපතේ යාමට ඉඩ නොතබන්න. අවශ්‍ය පමණට පමණක් ස්නානය සඳහා ජල කාරාම විවෘතව තබන්න. පිරිසිඳුව සෝදන සෑම තුවායක් සඳහාම වටිනා පිරිසිඳු ජලය පාවිච්චි වේ. මෙයට අමතරව රෙදි සෝදන සෑම අවස්ථාවකදීම, රෙදි සෝදන කුඩු විශාල ප්‍රමාණයක් පාවිච්චි කරනු ලබන අතර සෝදනු ලැබූ වතුර මුහුදට මුදා හරිනු ලැබේ තුවායක් වරකට වඩා පාවිච්චි කරන්න. හිරිගල් පරයට විශාල තර්ජනයක් වී ඇත්තේ නිෂ්ඵල ලෙස මුදාහරිනු ලබන ජලයයි.

ජලය ඉතිරි කරනු මැනවි !

## කිමිදුන්කරුවන් සහ දිය යට පිහිණුම් කරුවන්



කිමිදුම් කරුවන් සහ දිය යට පිහිණුම්කරුවන් වශයෙන් අප ආදර්ශමත් විය යුතුය. දිය යට ඇති ලොව ආරක්‍ෂාකර ගැනීමට අපට මහත් උනන්දුවක් ඇත. ඒ අනුව අප හැසිරෙයි. අප ස්පර්ශ කරනු ලබන්නේ නෙත් වලින් පමණි. ඡායාරූප ගැනීමේදී හෝ වීඩියේ ගත කිරීමේදී පවා කිසිවක් අප ස්පර්ශ කරන්නේ නැත. එසේම කිසිදු ප්‍රාණියෙකු පිළිබඳව ද අප අවධානය යොමු කරන්නේ නැත. අප නිතර හැසිරෙන්නේ දිය යට ආගන්තුකයෙකු වශයෙනි. අප ස්ථාවර තත්වයකට පත්වී අපගේ පිහිණුම් උපකරණවල චලනයවීම ගැන අවධානයෙන් සිටීමයි. කුඩා කොටස් වලින් කිසිදු හානියක් නොවනසේ වග බලා ගැනීමට අපගේ නීති සංග්‍රහය අනුව මෙම සවගීය අරක්‍ෂා කිරීමටත් වෙනත් අයට අපගේ හැසිරීමේ නීති ඉගැන්වීමටත් අවස්ථාවක් කරගත හැකිය.

කිමිදුම්කරුවෙක් හෝ දිය යට පිහිණුම්කරුවෙක් වශයෙන් අදර්ශයක් වන්න. !



## මූලික ප්‍රතිපත්ති.

මෙම අද්විතීය සවභාවික පුදුමය අරක්‍ෂා කිරීම සඳහා පළමු ප්‍රමුඛත්වය දියයුතු බවට මාලදිවයින රජය හඳුනාගෙන ඇත. මාලදිවයිනේ ස්වභාවික පුදුමය තබාගැනීමට උදව් වන්න. ඔබ, සංචාරකයෙකු වශයෙන් මලදිවයින අරක්‍ෂා කිරීම සඳහා ක්‍රියාකාරීව දායක වීමට අවස්ථාව සැළසී ඇත. සෑම සංචාරකයෙක්, සෑම මාලදිවයින් වැසියෙක්, සෑම සත්ත්වයෙක්, බොහෝවිට අනාගත පරම්පරාවට ඒ සඳහා ඔබට ස්තූති කරනු ඇත.

මෙම සිතිවිලි මූර්තිමත් කිරීම සඳහා නායකයෙකු වන්න. අපගේ ඉලක්කය ලඟා කර ගැනීමට හැකිවන්නේ අප සියල්ල එක්ව කටයුතු කළහොත් පමණි, මාලදිවයිනේ ස්වභාවික පුදුමය රැකගත යුතුය.

ඔබගේ සහයෝගයට බෙහෙවින් ස්තූති කරමු !

මාලදිවයිනේ දූපත් ආරක්‍ෂා කිරීම වනාහි මාලදිවයිනේ වහා හැඟීම් ඇතිවන පරිසර පද්ධතිය පිළිබඳව සංචාරකයින් දැනුවත් කිරීමේ ඉලක්කය සපුරාගැනීම සඳහා ලියාපදිංචි ලාභ නොලබන සමාජයකි. වැඩිමනත් තොරතුරු සඳහා අන්තර්ජාලයේ www.protectthemaldives.de වෙබ් අඩවියෙන් හෝ info@protectthemaldives.de යන විද්‍යුත් තැපැල් ලිපිනයෙන් අප හා එක්වන්න.

V3.0_Singhalese 01/2006